**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025.02.27


පැමිණිලිකරු : දිනූෂා සේරසිංහ මිය
නො. 93,
නල්ලවත්ත පාර,
මහරගම.

වගඋත්තර පාර්ශවය :

01. ඩී. එම්. සී. ජයවර්ධන මිය
උපගුරු,
බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය, (පෙර සේවය කළ)
මහරගම.

02. කේ. ඒ. චන්ද්‍රලතා මිය
විදුහල්පති,
බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය,
මහරගම.

03. සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
ශ්‍රී ජයවර්ධනපුර.

04. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය,
මහරගම.

05. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
රන්මහපාය,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

06. ස්ථානාධිපති
ළමා හා කාන්තා කාර්යාංශය,
පොලිස් ස්ථානය,
මහරගම.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**<u>පැමිණිලි අංකය : HRC/HO/1996/22</u>**

ඉහත පැමිණිලි අංක යටතේ පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2022.06.16 දිනැතිව පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමාගේ වයස අවුරුදු 11 ක් වූ (සිදුවීම සිදුවූ කාලසීමාව වන විට) කලණි එරංගා සේරසිංහ දියණිය මහරගම බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ 6 සී ශ්‍රේණියේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන බවත්, 2022.06.08 දින සිය දියණියහට පාසලේ බටහිර සංගීත විෂය උගන්වනු ලබන චම්පිකා ජයර්ධන නැමති ගුරුවරිය විසින් අමානුෂික ලෙස පහරදී ඇති බවත් සඳහන් කර ඇත. මෙකී පහරදීමට හේතුව ලෙස සිය දියණිය විසින් ඇයගේ මිතුරියන්හට බටහිර සංගීත විෂයට අදාළ සටහන් WhatsApp මගින් යොමු කිරීම බව දක්වා ඇත. මෙම ගුරුවරිය විසින් තමාගේ දියණියගේ කොන්ද මැද ප්‍රදේශයට පහර 10 ට වැඩි ප්‍රමාණයක් පහරදී ඇති බවත් මේ පිළිබඳම තමා සිය දියණියගෙන් සහ දියණියගේ පන්තියේ මිතුරියන්ගෙන් දැනගැනීමට ලැබුණි බවත් සඳහන් කර ඇත. තවද දියණිය වෙත ගුරුතුමිය විසින් අමානුෂික ලෙස බැණ වැදී ඇති බවත් එදින පාසල අවසන්වී දියණිය නිවසට පැමිණෙන විට දියණියගේ කොන්ද ප්‍රදේශය ඉදිමී නිල් පැහැ වී තිබූ බවත් සඳහන් කර ඇත. මෙකී සිදුවීම හේතුවෙන් සිය දියණිය මානසිකව පීඩාවටත්, බියටත් පත්වී සිටින බව වැඩිදුරටත් සඳහන් කර ඇත. තමා විසින් මෙම සිදුවීම සිදුවූ දින එනම් 2022.06.08 දින මහරගම පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය වෙත ගොස් පැමිණිල්ලක් සිදුකළ බවත්, එහිදී පොලිස් නිලධාරිනියක් විසින් සිය දියණිය පරීක්ෂා කළ බවත් දියණියගේ කොන්ද ප්‍රදේශය නිල් පැහැ වී ඉදිමී තිබූ බවට නිරීක්ෂණය කළ බවත් සඳහන් කර ඇත. පසුව 2022.06.09 දින කළුබෝවිල රෝහල වෙත සිය දියණිය රැගෙන ගිය බවත් එහිදී වෛද්‍යවරුන්ගේ පරීක්ෂාවෙන් පසු දියණිය රෝහල් ගත කරනු ලැබූ බවත් දක්වා ඇත. 2022.06.10 දින දියණිය මනෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ද යොමු කර ඇති අතර එහිදී ගුරුවරියගේ මෙම ක්‍රියාව හේතුවෙන් දැරිය බියට පත්ව සිටින බවට වෛද්‍යවරුන් සඳහන් කළ බව ප්‍රකාශ කර ඇත. තමා විසින් 2022.06.08 දින ළමා රක්ෂණ අධිකාරිය වෙත සිදුකරන ලද පැමිණිල්ල සඳහා මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් 2022.06.11 දින මහරගම පොලිස් ස්ථානය විසින් අදාළ ගුරුවරිය ගංගොඩවිල උසාවියට ඉදිරිපත් කර ඇති බවත් එදින එම ගුරුවරියහට අධිකරණය මගින් ඇප ලබාදී ඇති බවත් සඳහන් කර ඇත. තවද පැමිණිලිකරු විසින් 2022.10.28 දිනැතිව ලිපියක් යොමුකරමින් තම දියණිය පෞද්ගලික පාසලක් වෙත ඇතුළත් කළ බවත් මෙම සිදුවීමෙන් පසු දියණිය මනෝවෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටින බවත් සඳහන් කර ඇත.

තවත මෙම පැමිණිල්ල කොමිෂන් සභාව වෙත වින්දිත දැරියගේ මව විසින් යොමුකර ඇති අතර කොමිෂන් සභාව විසින් පැමිණිල්ල විභාගයට ගන්නා ලද දිනයන්හිදී පැමිණිලි පාර්ශවය වෙනුවෙන්එක්සත් මානව හිමිකම් සංවිධානය නැමති රාජ්‍ය නොවන සංවිධානය ද පෙනී සිට ඇත.

2023.01.26 දිනැතිව පැමිලිකාරිය විසින් කොමිෂන් සභාවට ලිපියක් යොමුකරමින් ඉහත නම් සඳහන් සංවිධානය ඔවුන් වෙනුවෙන් පෙනී සිටින බව කොමිෂන් සභාවට ලිඛිතව දැනුම් දී තිබේ.

ඉහත දක්වන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු ආරම්භ කරමින් බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ විදුහල්පති වෙතින් වාර්තාවක් කැඳවා ඇත. ඊට පිළිතුරු ලෙස 2022.10.14 දිනැතිව කේ. ඒ චන්ද්‍රලතා මිය (විදුහල්පති) විසින් කොමිෂන් සභාව වෙත ලිපියක් යොමුකරමින් සඳහන් කර ඇත්තේ, 2022 වර්ෂයේ 6 සී ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ කළණි එරංගා සේරසිංහ දියණිය 2022.07.06 වන දින එම පාසලෙන් අස්වීම ලබාගෙන ඇති බවයි. තවද මෙම සිදුවීමට අදාළ ගුරුවරිය බස්නාහිර පළාත් අධ්‍යක්ෂතුමාගේ 2022.07.29 දිනැති ලිපිය අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ස්ථාන මාරු කර ඇති බවත් එකී ස්ථාන මාරු කිරීම හේතුවෙන් මෙම පාසලේ බටහිර සංගීත විෂය ඉගැන්වීම සඳහා ගුරුවරයෙක් නොමැති වීම හේතුවෙන් අනෙකුත් සිසු දරුවන් අගතියට පත්වී සිටින බවත් සඳහන් කර තිබේ. තවද මෙම සිදුවීම සම්බන්ධයෙන් අගතියට පත් දැරියගේ දෙමාපියන් විසින් මේවන තෙක් තමා දැනුවත් කර නොමැති බවත් මෙම සිදුවීම පිළිබඳව තමා මුලින්ම දැනුවත් වූයේ 2022.06.09 දින මහරගම පොලිස් ස්ථානය විසින් ලබාදුන් දුරකථන ඇමතුම මගින් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර විභාග කිරීම කිරීම සඳහා 2022.10.28 දින කේ. ඒ. චන්ද්‍රලතා මිය (විදුහල්පති - බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය), ඩී. එම්. චම්පිකා ජයවර්ධන මිය (බටහිර සංගීත විෂයභාර) සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන වගඋත්තර පාර්ශවයන් ද, 2022.12.13 යන දින මහරගම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, ස්ථානාධිපති මහරගම සහ ඉනෝකා රණවීම මිය (බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය) යන වගඋත්තර පාර්ශවයන් කැඳවා ඇත. එහෙත් ඉහත සඳහන් වගඋත්තර පාර්ශවයන් මෙම දින දෙකේදී ම පැමිණිල්ල විභාග කිරීම සඳහා පැමිණ නොමැති අතර පැමිණිලි පාර්ශවය පමණක් ඒ සඳහා සහභාගී වී ඇත. එබැවින් නැවතත් 2023.01.31 දින ඉහත දක්වන ලද සියලුම වගඋත්තර පාර්ශවයන් කැඳවා ඇති අතර එදින සියලුම වගඋත්තර පාර්ශවයන් පැමිණිල්ල විභාගය සඳහා පැමිණ ඇති නමුත් පැමිණිලි පාර්ශවය එදින පරීක්ෂණය සඳහා පෙනී සිට නොමැත. එදින සහභාගී වූ වගඋත්තර පාර්ශවයන් වෙතින් ලබාගන්නා ලද ප්‍රකාශ පහත පරිදි වේ.

**පළමු වන වගඋත්තරකරු - ඩී. එම්. සී. ජයවර්ධන මිය (උපගුරු)**

පැමිණිල්ලේ සඳහන් සිදුවීමට අදාළ ප්‍රධාන වගඋත්තරකරු වන බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ බටහිර සංගීත විෂය ඉගැන්වීම් කටයුතු සිදුකරන ලද ඩී. එම්. සී. ජයවර්ධන මිය 2023.01.31 දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. අගතියට පත් පැමිණිලිකාරියගේ දියණිය මෙම පාසලේ 6 සී ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත් එම දැරිය විසින් තමාගේ අනුදැනුමකින් තොරව

පන්තියේ සිදුකරන ඉගැන්වීම් සම්බන්ධයෙන් වට්සැප් සමූහයක් සකස් කර ඒ හරහා අනෙකුත් දරුවන්ට ඒවා යොමු කිරීමට කටයුතු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් එම දැරියගෙන් තමා විමසා එම දැරියට අවවාද කිරීමක් සිදු කළ බවත් පැමිණිලිකාර පාර්ශවය සඳහන් කරන ආකාරයේ අමානුෂික පහරදීමක් අදාළ දැරියට සිදු නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

**දෙවන වගඋත්තරකරු - කේ. ඒ. චන්ද්‍රලතා මිය (විදුහල්පති - බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය)**

දෙවන වගඋත්තරකරු වන බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් 2023.01.31 දින පැමිණිල්ල විභාගයේ දී කොමිෂන් සභාව වෙත 2022.10.14 දිනැතිව යොමුකරන ලද ලිපියෙහි සඳහන් කරුණු ම ප්‍රකාශ කර ඇති අතර ඊට වැඩි යමක් ප්‍රකාශ කර නොමැත.

**තෙවන වගඋත්තරකරු - සභාපති (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)**

තෙවන වගඋත්තරකරු වෙනුවෙන් 2023.01.31 දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලද ආර්. ඒ. ලෝචනා රණසිංහ මිය (නීති නිලධාරි) විසින් 2023.01.30 දිනැතිව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ අත්සනින් යුතු ලිඛිත කරුණු දැක්වීමක් කොමිෂන් සභාව වෙත යොමුකරමින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී තිබේ. වයස අවුරුදු 11 ක් වූ වින්දිත දැරියහට බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ බටහිර සංගීත විෂය ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් 2022.06.08 වනි දින දැරියගේ කොන්ද ප්‍රදේශයට පහර දී ඇති බවට 1929 දරණ ළමා උපකාරක ක්ෂණික ඇමතුම් අංකය වෙත දැරියගේ මව විසින් පැමිණිලි කර ඇති බව ප්‍රකාශ කර ඇත. එකී පහර දීම හේතුවෙන් දැරියගේ කොන්ද ප්‍රදේශය රත් පැහැගැන්වී ඇති බව සහ ඒ හේතුවෙන් එම දැරිය රෝහල් ගත කිරීමට සූදානම් වන බව පැවසූ බවත් ප්‍රකාශ කර තිබේ. ඒ අනුව ජාති ළමා ආරක්ෂක අධිකාරි පනතේ බලතල ප්‍රකාරව එම තොරතුරු මහරගම පොලිස් ස්ථානය වෙත දැනුම්දෙන ලද බවත් පහර දීමට අදාළව විමර්ශනයක් සිදුකර මෙම සිදුවීමට අදාළව නීතිය බලාත්මක කර වාර්තාවක් යොමුකරන ලෙස මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත දන්වා ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත බී/4988/22 දරණ අංක යටතේ කරුණු වාර්තා කර ඇති බවත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සැකකාර ගුරුවරිය වෙත අධිකරණය මගින් ඇප නියම කර පැමිණිල්ල සමථ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බවත් සමථ මණ්ඩල වාර්තාව 2023.03.22 දින කැඳවීමට නියම කර ඇති බවත් ප්‍රකාශ කර තිබේ. ඊට අමතරව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මේ පිළිබඳව බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද දැන්වීමක් සිදුකරමින් පාසල් දරුවන් හිංසනයට ලක්වීම පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ බලාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් මෙකී ගුරුවරියගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් දැන්වීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

මෙදින කොමිෂන් සභාව වෙත 2023.01.30 දිනැතිව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීමෙහි ද දක්වා ඇත්තේ නීති නිලධාරිනිය විසින් පැමිණිල්ල විභාගයේ දී සඳහන් කරන ලද කරුණුම බව නිරීක්ෂණ වේ.

**සිව්වන වගඋත්තරකරු - කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ (කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, මහරගම)**

2023.01.31 දින පැමිණිල්ල විභාගය සඳහා ඩබ්. බී. එල් ගුණරත්න මිය (කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ) කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. මෙම සිදුවීමෙන් සතියකට පමණ පසු වින්දිත දැරියගේ දෙමව්පියන් තමා මුණගැසීමට මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය වෙත පැමිණි බවත් මෙම සිදුවීම තමන් වෙත ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව තමා විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය වෙත දැනුවූ බවත් එම අවස්ථාවේ දී කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ උපදෙස් පරිදි දැරියගේ දෙමාපියන් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය වෙත යොමු කළ බවත් ඉන් පසුව කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය විසින් ලබාදෙන ලද උපදෙස් පරිදි මෙම සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර අදාළ වාර්තාව කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය වෙත යොමුකරන ලද බවත් ප්‍රකාශ කර ඇත. තවත මෙම සිදුවීම සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේ දී අදාළ වින්දිත දැරියට සිදුකරන ලද පහරදීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි ලබාදීමට එම පාසලේ සිසු දැරියන් ඉදිරිපත් වී නොමැති බව විමර්ශනයේ දී අනාවරණය වී ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ.

**පස්වන වගඋත්තරකරු - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (බස්නාහර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව)**

2023.01.31 දින පැමිණිල්ල විභාගය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවෙන් සී. කේ. ඩබ්. හේවගේ මහත්මිය (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - පාලන) කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිරීමෙන් අනතුරුව එම දැරියගේ මව විසින් ද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇති බව ප්‍රකාශ කර තිබේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කර වාර්තාවක් ලබාදෙන ලෙස ජයවර්ධනපුර කළාප අධ්‍යාප අධ්‍යක්ෂ වෙත දැනුම්දී ඇති බවත් එකී දැනුම්දීම අනුව මහරගම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරිය විසින් මේ පිළිබඳව විමර්ශනයක් සිදුකර විමර්ශන වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත් එම වාර්තාවෙහි දක්වා ඇති නිර්දේශ ප්‍රකාරව 2022.07.29 දිනැති ලිපිය මගින් විමර්ශන හේතූන් මත වගඋත්තකාර ගුරුවරිය වන ඩී. එම්. සී. ජයවර්ධන මිය කොළඹ කලාපයේ පුරප්පාඩු පවතින පාසලක් වෙත ස්ථානමාරු කිරීම සඳහා කොළඹ කලාප කාර්යාලය වෙත ස්ථාන මාරු කරන ලද බව ප්‍රකාශ කර තිබේ. ඊට අමතරව එම වාර්තාවෙහි සඳහන් අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ජයවර්ධනපුර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2022.07.18 දිනැති ලිපිය මගින් දන්වා ඇති බවත් ඒ අනුව උක්ත නම් සඳහන් ගුරුවරිය 2022.10.05 දින කොළඹ ලින්ඩ්සේ බාලිකා විදුහල වෙත ස්ථාන මාරු කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**හයවන වගඋත්තරකරු - ස්ථානාධිපති (ළමා හා කාන්තා කාර්යාංශය, මහරගම පොලිස් ස්ථානය)**

2023.01.31 දින පැමිණිල්ල විභාගය සඳහා මහරගම පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති කාන්තා උප පොලිස් පරීක්ෂක ඩබ්. ජී. ඒ. ඊ. ජයලංකා මිය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා විසින් 2022.12.24 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් සිදුකර ඇති බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දැනුම්දීම පරිදි සහ අදාළ දෙමාපියන් විසින් මහරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව ප්‍රකාශ කර තිබේ. තවද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ප්‍රකාශ කළ පරිදි මෙම නඩුව අධිකරණය විසින් සමථ මණ්ඩලයට යොමුකර ඇති බවත් 2023.03.22 සමථ වාර්ථාව අධිකරණ වෙත යොමු කිරීමට නියෝග ලබාදී ඇති බවත් ප්‍රකාශ කර තිබේ. එමෙන්ම මෙම වින්දිත දැරිය අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමුකර අධිකරණ වෛද්‍ය වාර්තාව ද ලබාගෙන ඇති බවත් මෙම සිදුවීමට අදාළව පාසලේ වෙනත් දරුවන්ගේ සාක්ෂි ලබාදීමට දරුවන් ඉදිරිපත් වී නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීම :**

මහරගම පොලිස් ස්ථානය විසින් 2022.06.09 දින ප.ව. 3.45 පමණ වින්දිත දැරිය අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා කළුබොවිල ශික්ෂණ රෝහල වෙත යොමුකර තිබේ. ඒ අනුව කළුබෝවිල අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය දකුණු කොළඹ වෙතින් 2022.12.23 දිනැතිව CL/ML/18/09/06/22 දරණ යොමු අංක යටතේ මෙකී වින්දිත දැරියට සිදු වූ පහරදීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවක් නිකුත් කර ඇත. එම වාර්තාවේ දක්වා ඇති කරුණු පහත පරිදි වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි රෝගියා විසින් ලබාදෙන ලද කෙටි රෝග ඉතිහාසය යන්නෙහි, වින්දිත දැරිය විසින් ලබාදෙන ලද ප්‍රකාශයූ ලෙස "බටහිර සංගීතය විෂය උගන්වනු ලබන ගුරුවරිය අදාළ සිදුවීමට පෙර දින එනම් 2022.06.07 දින ඉගැන්වීම් කටයුතු සඳහා පන්ති කාමරයට නොපැමිණි බවත්, වෙනත් පන්තියක වැඩිහිටි ශිෂ්‍යාවක් වෙත එදිනට අදාළ සටහන් ලබාදී තිබූ බවත්, එම දැරිය විසින් තමාට එම සටහන් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. වින්දිත දැරිය විසින් එම සටහන් පන්තියේ කලු ලෑල්ලේ ලිවීම සඳහා පන්තියේ වෙනත් දැරියක් වෙත ලබාදුන් නමුත් සම්පූර්ණ සටහන් ලිවීම සඳහා වේලාව නොතිබූ බැවින් තමා එම සටහන් නිවසට රැගෙන ගොස් WhtasApp Group එකක් නිර්මාණය කර අදාළ සටහන් පන්තියේ ළමයින් වෙත ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. ඊට පසු දින එනම් 2022.06.08 දින පාසල් ගිය පසු පළමු කාල පරිච්ඡේදයේ දී මෙම ගුරුවරිය එම සටහන් පිළිබඳව විමසීමේ දී තමා එම සටහන් පන්තියේ දමා පැමිණි බැවින් 6 සී පනන්තියට ගොස් එම සටහන් රැගෙන පැමිණි බවත් එම අවස්ථාවේදී ගුරුවරිය තමාගෙන් සටහන් උදුරාගෙන අත දිගැහර තමාගේ කොන්ද ප්‍රදේශයේ මැදට පහරවල් 10 ක් 15 ක් පමණ එක දිගට පහර දුන් බවත් ප්‍රකාශ තර ඇත. එම පහරදීම හේතුවෙන් තමා විසිවී ගිය බවත් ගුරුවරිය විසින් තමාව නැවත ඇදල අරගෙන කාගෙන් අහලද Group

එකක් හැදුවේ යනුවෙන් විමසූ බවත්" ප්‍රකාශ කළ බව එහි සටහන් කර ඇත. මෙකී තොරතුරු අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත දැරිය පරික්ෂා කිරීමෙන් අනතුරුව පහත සඳහන් රෝග නිරීක්ෂණ සටහන් කර තිබේ.

1. බාහිරට පෙනීමට තුවාල කිසිවක් නොමැත. කෙසේනමුත්, පපුවේ පිටුපස ප්‍රදේශයේ දෙපස වේදනාවක් පවති. (No External injuries in the body. However, palpation revealed painful area (tenderness) on the back of both sides of the chest)

2. කිසියම් පුද්ගලයෙකු කම්පන සහගත සිදුවීමකට මුහුණදුන් පසු එකී කම්පනය හේතුවෙන් එම පුද්ගලයාගේ හෘදය හෝ උදරයේ අවයව වටා රුධිරය එකතුවී තිබේද යන්න පරික්ෂා කිරීම සඳහා සිදුකරන ලද ස්කෑන් පරික්ෂාව සෘණාත්මක බව දක්වා ඇත. (FAST Abdominal scan – Negative)

3. පපුව සම්බන්ධයෙන් සිදුකරන ලද X-ray පරික්ෂාව මගින් අස්ථි බිඳීමක් නොමැති බව දක්වා ඇත. (X-ray Chest – No Fractures)

4. ලුම්බිම් කොඳු ඇට පෙළෙහි පැති පරික්ෂාව සඳහා සිදුකරන ලද X-ray පරික්ෂාව මගින් අස්ථි බිඳීමක් හෝ විස්තාපනයක් සිදුවී නොමැති බව දක්වා ඇත. (X-ray Lumbar spine AP and lateral views – No fractures / dislocations)

5. 2022.06.10 දින වින්දිත දරුවා විශේෂඥ ළමා මනෝ වෛද්‍යවරුයෙකු වෙත යොමුකරන ලද බවත් එහිදී, මෙම සිදුවීම හේතුවෙන් දැරිය ආතතියට පත්වී ඇති බවත් දැරියට පශ්චාත් ක්ලමථ අක්‍රමතාවය හෝ විශාදය වර්ධනය වීමේ අවධානමක් පවතින බවත් සඳහන් කර ඇති බව දක්වා ඇත. දැරිය සඳහා ප්‍රතිකාර ආරම්භ කර ළමා මාර්ගෝපදේශ සායනයක් වෙත යොමුකිරීම සුදුසු බවට නිර්දේශ කර ඇති බවත් දක්වා ඇත. (Child has Acute Stress Reaction due to the alleged act. She has a risk of developing Post Traumatic Stress Disorder / Depression. She was started on treatment and recommended to attend the child guidance clinic)

අධිකරණ වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් දරණ මතය ලෙස, "බාහිරින් පෙනීමට ශරීරයේ තුවාල කිසිවක් නොමැත.පපුවේ පිටුපස ප්‍රදේශයේ දෙපස වේදනාවක් පවතින බවත් එය මෙම සිදුවීමට අදාළ පහරදීම හේතුවෙන් ඇතිවූවක් විය හැක. දැරිය මෙම සිදුවීම හේතුවෙන් ආතතියට පත්වී ඇති අතර එබැවින් දැරියට පශ්චාත් ක්මථ අක්‍රමතාවය හෝ විශාදය වර්ධනයවීමේ අවධානමක් ඇත. එබැවින් ළමා මාර්ගෝපදේශ සායනක් වෙත යොමුකරන ලදි." (No External injuries in the body. The painful areas on the back of the chest revealed by palpation could have been caused by alleged incident of assault. (Blunt force) Child has Acute Stress Reaction due to the alleged act. She has a risk of developing Post Traumatic Stress Disorder / Depression. And has been referred to child guidance clinic)

ඉහත දක්වන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි සහ අධිකරණ වෛද්‍යවරයාගේ මතය අනුව, මෙම වින්දිත දැරියට පළමු වගඋත්තරකාරිය විසින් පහරදුන් බවට බාහිරින් පෙනීමට පහරදීමක සලකුණු නොමැති වුවද දැරියගේ පපුවේ පිටුපස ප්‍රදේශයේ වූ වේදනාව මෙකී පහරදීම හේතුවෙන් ඇතිවූවක් විය හැකි බවට සඳහන් කර තිබේ. තවද මෙකී සිදුවීම හේතුවෙන් දැරිය මානසික ආතතියට පත්ව තිබීම සහ පශ්චාත් ක්ලමථ අක්‍රමතාවය හෝ විශාදය වැනි මානසික අක්‍රමතාවයකට පත්වීමේ අවධානමක් පවතින බවට දක්වා තිබීම තුළින් එවැනි තත්ත්වයකට වයස අවුරුදු 11 ක දැරියක් ගොදුරු වීම සඳහා මානසික කම්පනයකට ඇය ගොදුරු වී තිබිය යුතු බව පෙනීයයි.

විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු :

- පැමිණිලිකාරිය වන වින්දිත දැරියගේ මව විසින් මහරගම පොලිස් ස්ථානය වෙත 2022.06.08 දින පැය 22.00 ට WCIB 301/75 යටතේ පැමිණිල්ලක් සිදු කර ඇත. එකී පැමිණිල්ලෙහි පළමුවන වගඋත්තරකාරිය විසින් වින්දිත දැරියට සිදුකරන ලද පහරදීම සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත. මෙම සිදුවීමට පාත්‍ර වූ වින්දිත දැරිය මහරගම පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරිනියක් විසින් පරික්ෂා කර බලා ඇති අතර, “දැරියගේ පිට මැද නිල් පාට තැලුම් පහරවල් දක්නට ඇති අතර දැරිය බියට පත්වී සිටින බවත් ඇයගේ ශරීරයේ බාහිරින් පෙනීමට වෙනත් කිසිදු තුවාලයක් නොමැත” යනුවෙන් නිරීක්ෂණ සටහන් යොදා ඇත.
- වින්දිත දැරියගේ ප්‍රකාශය WCIB 301/76 යටතේ සටහන් කර ඇති අතර, එකී ප්‍රකාශයෙහි අදාළ ගුරුවරිය විසින් තමාට සිදු කරන ලද පහරදීම සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් සහිත ප්‍රකාශයක් ලබාදී ඇත.
- 2022.06.11 දින මෙකී සිදුවීමේ වගඋත්තරකාරිය වන ඩී. එම්. සී. ජයවර්ධන මිය වෙතින් ප්‍රකාශයක් ලබාගනිමින් WCIB 338/111 යටතේ සටහන් කර ඇත. එම ප්‍රකාශයෙහි, “තමා පන්තියේ සියලු දරුවන්ට අවවාද කරමින් දරුවන්ට හිතුමතේ අන්තර්ජාලය භාවිතා කළ නොහැකි බවත් වට්සැප් සමූහ සෑදීම කළ නොහැකි බවත් සියලුම දෙනාට එම සමූහයෙන් ඉවත් වෙන ලෙසත් ප්‍රකාශ කළ බවත්, වින්දිත දැරියට ද ඒ ආකාරයෙන්ම අවවාද කර තමාගේ හුරු අතින් එම දැරියගේ පිට ප්‍රදේශයට පහර වල් දෙකක් ගැසූ බවට” ප්‍රකාශයක් ලබාදී ඇත.
- මෙම සිදුවීම සම්බන්ධයෙන් මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය විසින් විමර්ශනයක් පවත්වා ඇත. එකී විමර්ශන වාර්තාවෙහි පිටපතක් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර එහි සඳහන් කරුණු පහත පරිදි වේ.
- 2022.06.16 දින කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය විසින් මෙම සිදුවීම පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම සඳහා බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයට ගොස් කරුණු සටහන් කර ගැනීම සිදුකර ඇත. එහිදී වින්දිත දැරිය පාසලට නොපැමිණෙන බව නිරීක්ෂණ කර ඇති අතර 6 සී පන්තිය භාරව කටයුතු කරනු ලබන ටී. ජෙයප්‍රියා මිය, අංශ ප්‍රධානි එස්. එම්. විරාජනී මිය හා බටහිර සංගීතය විෂය

ඉගැන්වීම් සිදුකරන ඩී. එම්. චම්පිකා ජයවර්ධන මිය යන අයගෙන් ප්‍රකාශ ලබාගෙන ඇත. ඒ අනුව පළමු වන වගඋත්තරකරු වන ඩී. එම්. චම්පිකා ජයවර්ධන මිය විසින් "කුඩා දරුවන් අන්තර්ජාලය භාවිතා කිරීම නොකළ යුතු දෙයක් බැවින් සිසුන් පැවසූ කරුණු අනුව වින්දිත සිසුවියට තමන් පහර දුන් බවත් එම දැරිය තමා පළමුවරට දුටුවේ එදින බව ද" ප්‍රකාශයක් ලබාදී ඇති බව සඳහන් කර ඇත.

❖ උක්ත වාර්තාවේ නිගමන ලෙස 6 සී පන්තියේ ඉගෙනුම ලබන මෙකී පැමිණිල්ලෙහි වින්දිත දැරියහට කරුණු විමසා බැලීමකින් තොරව පළමුවන වගඋත්තරකරු වන ඩී. එම්. චම්පිකා ජයවර්ධන මිය විසින් සිසුන් ඉදිරි පිට දී පහරදී ඇති බවත් චක්‍රලේඛ අංක 2005/17 අනුව සිසුන්ට ශාරීරික දඬුවම් ලබාදිය නොහැකි බවත් දක්වා ඇත.

❖ එමෙන්ම මෙම ගුරුවරිය විසින් 2022.06.07 දින කෙටි නිවාඩුවක් ලබාගැනීම හේතුවෙන් 6 ශ්‍රේණියේ සිසුන් වෙත පැවරුම් ලබාදුන් බව ප්‍රකාශ කළ ද එදින දින 6 ශ්‍රේණියේ සිසුන්ට බටහිර සංගීතය විෂය යෙදී ඇත්තේ 6 සහ 7 වන කාලපරිච්ඡේදවල බවත්, ගුරුභවතෙකු නිවාඩු ලබාගන්නා අවස්ථාවල දී සහන කාලපරිච්ඡේද සඳහා ගුරුභවතුන් යෙදවීම සිදු කළ යුතු වුවත් මෙදින ඒ සඳහා ගුරුභවතෙකු සේවයේ යොදවා නොමැති බවට තහවුරු වන බව සඳහන් කර ඇත.

❖ එම වාර්තාවෙහි දක්වා ඇති පරිදි, තම විෂය හදාරන සිසුන් පිළිබඳ ගුරුභවතුන් වගකිව යුතු වුවත්, බටහිර සංගීත විෂය හදාරන සිසුන්ගේ සටහනක් මෙම ගුරුවරිය විසින් තබාගෙන නොමැති අතර, පහර කෑමට ලක් වූ වින්දිත සිසුවිය තමන් දුටු පළමු අවස්ථාව මෙම සිදුවීම සිදුවූ දිනය බව පළමුවන වගඋත්තරකරු වන ඩී. එම්. චම්පිකා ජයවර්ධන මිය ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත.

❖ එකී වාර්තාව අනුව වින්දිත දැරියගේ මව විසින් 6 සී පන්තිය භාරව කටයුතු කරනු ලබන ටී. ජෙයප්‍රියා මිය දැනුවත් කර ඇති අතර එම ගුරුවරිය විසින් 6 ශ්‍රේණි ප්‍රධාන එස්. එම්. විරාජනී මිය දැනුවත් කර ඇත. එහෙත් එස්. එම්. විරාජනී මිය විසින් ඉහළ නිලධාරීන් එම අවස්ථාවේ දී හෝ ඉන් පසුව හෝ දැනුවත් කර නොමැති බව උක්ත වාර්තාවේ සඳහන් වේ.

❖ පාසලේ සහකාර විදුහල්පති ලෙස කටයුතු කරනු ලබන අමා නිලංගි විජේසේකර මිය වෙත වින්දිත දැරියගේ මව විසින් දුරකථන ඇමතුමක් ලබාදී මෙම සිදුවීම දන්වා තිබුණ ද, එම නිලධාරිනිය විසින් මේ පිළිබඳව කිසිදු සොයාබැලීමක් සිදුකර නොමැති බවත් විදුහල්පති වෙත එම අවස්ථාවේ දී හෝ ඉන් පසුව හෝ මේ පිළිබඳව දැනුම්දීමට කටයුතු කර නොමැති බව ද ඉහත වාර්තාවේ සඳහන් වේ.

❖ තවද මෙම සිදුවීමට පසුදින හෝ වින්දිත දැරිය සම්බන්ධයෙන් පාසලේ කිසිදු ගුරුවරයෙක් විසින් සොයා බැලීමක් සිදුකර නොමැති බවත් ගුරුභවතුන් සහ නිලධාරීන් තම රාජකාරිය පිළිබඳව වගකීමකින් තොරව කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වන බව උක්ත වාර්තාවෙහි වැඩිදුරටත් සඳහන් කර ඇත.

නිරීක්ෂණ :

❖ පැමිණිල්ලෙහි දක්වා ඇති පරිදි පැමිණිලිකාරියගේ වයස අවුරුදු 11 ක් වූ 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන කලණි එරංගා සේරසිංහ යන දැරිය විසින්, මෙම සිදුවීම සිදුවූ දින එනම් 2022.06.08 දින රාත්‍රියේ සිය මවට බටහිර සංගීතය විෂය උගන්වනු ලබන ඩී. එම්. චම්පිකා ජයවර්ධන ගුරුතුමිය (පළමු වගඋත්තරකරු) විසින් තමාට පහරදුන්නා යැයි පැවසූ බව පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. වින්දිත දැරියගේ එම ප්‍රකාශනය මෙම පැමිණිල්ලේ වැදගත් සාක්ෂියක් ලෙස නිරීක්ෂණය වේ. තවද එම අවස්ථාවේදීම පැමිණිලිකාරිය වන වින්දිත දැරියගේ මව විසින් දැරිය පරික්ෂා කර ඇති අතර, එහිදී දැරියගේ කොන්ද ප්‍රදේශය පහර කෑම හේතුවෙන් රතු වී ඉදිමී තිබූ බවට පැමිණිලිකාරිය විසින් දුටු බව සඳහන් කර ඇත. එම සාක්ෂිය මෙවැනි පහරදීමක් සිදුවී ඇද්ද යන්න සම්බන්ධයෙන් පළමු වරට නිරීක්ෂණය කරන ලද ඇසින්දුටු සාක්ෂියක් බවට පැහැදිලි වේ.

❖ එමෙන්ම 2022.06.08 දින පැමිණිලිකාරිය විසින් මෙම පහරදීම සම්බන්ධයෙන් මහරගම පොලිස් ස්ථානයට පැමිණිලි කළ පසු එම ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරිනියක් විසින් වින්දිත දැරිය පරික්ෂා කර ඇති අතර එහිදී පහරදීමක සලකුණු දුටු බවට නිරීක්ෂණ සටහන් යොදා ඇත. එය මෙම පහරදීම සිදුවූ දින රාත්‍රි 8.45 පමණ යොදන ලද නිරීක්ෂණ සටහනක් වන අතර ඒ වන විටත් දැරියගේ කොන්ද ප්‍රදේශයේ පහරදීමක සලකුණු තිබී ඇති බවට පැහැදිලි වේ.

❖ තවද වින්දිත දැරිය 2022.06.09 වන දින ප.ව. 3.45 පමණ කළුබෝවිල ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමුකර ඇති අතර දැරිය පරික්ෂා කිරීමෙන් පසු අධිකරණ වෛද්‍යවරයා විසින් 2022.12.23 දිනැතිව CL/ML/18/09/06/22 දරණ යොමු අංක යටතේ නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි අධිකරණ වෛද්‍යවරයාගේ මතය ලෙස, මෙම වින්දිත දැරියට පළමු වගඋත්තරකාරිය විසින් පහරදුන් බවට බාහිරින් පෙනීමට පහරදීමක සලකුණු නොමැති වුවද දැරියගේ පපුවේ පිටුපස ප්‍රදේශයේ වූ වේදනාව මෙකී පහරදීම හේතුවෙන් ඇතිවූවක් විය හැකි බවට සඳහන් කර තිබේ. තවද මෙම සිදුවීම හේතුවෙන් දැරිය මානසික ආතතියට පත්ව ඇති බවත්, ඒ හේතුවෙන් දැරිය පශ්චාත් ක්ලමථ අක්‍රමතාවය හෝ විශාදය වැනි මානසික අක්‍රමතාවයකට පත්වීමේ අවධානමක් පවතින බවට සඳහන් කර ඇත. ඒ අනුව වයස අවුරුදු 11 ක දැරියක් එවැනි මානසික අක්‍රමතාවයකට ගොදුරු වීමේ අවධානමකට ලක්වීමට තරම් මානසික කම්පනයකට වින්දිත දැරිය ගොදුරු වී තිබිය යුතු බව කොමිෂන් සභාවට පෙනීයයි. ඒ අනුව පළමුවන වගඋත්තරකාරිය විසින් මෙකී සිදුවීම මුල් කර ගනිමින් වින්දිත දැරියගේ කොන්ද ප්‍රදේශයට පහරදීමක් සිදුකර ඇති බවට නිරීක්ෂණ වේ.

❖ එමෙන්ම පළමුවන වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් 2022.06.11 දින WCIB 338/111 යටතේ මහරගම පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය වෙත ප්‍රකාශයක් ලබාදෙමින් වින්දිත දැරියගේ කොන්ද ප්‍රදේශයට අතින් පහරවල් දෙකක් ගැසූ බවට ප්‍රකාශ කර තිබේ. තවද 2022.06.16 දින මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් සිදුකරන ලද

විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබාදෙමින් වින්දිත දැරියට තමා පහරදුන් බවට ප්‍රකාශයක් ලබාදී ඇත. එහෙත් මෙම වගඋත්තරකරු විසින් 2023.01.31 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ, වින්දිත දැරියට අවවාද කිරීමක් සිදු කළ බවත් පැමිණිලිකාර පාර්ශවය සඳහන් කරන ආකාරයේ අමානුෂික පහරදීමක් තමා සිදු නොකළ බවත් ය. ඒ අනුව මෙම වගඋත්තරකරු විසින් ලබාදී ඇති ප්‍රකාශ දෙක එකිනෙකට පරස්පර විරෝධී වන බව නිරීක්ෂණය වේ.

- මෙම සිදුවීම සම්බන්ධයෙන් මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් 2022.06.16 දින පාසල වෙත ගොස් ප්‍රකාශ සටහන් කර ගනිමින් විමර්ශනයක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. එකී විමර්ශනයට අදාළ වාර්තාව මගින් දක්වා ඇති කරුණු අනුව, පළමුවන වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් වින්දිත දැරියට සිසුන් ඉදිරියේ පහරදී ඇති බවත්, මෙකී සිදුවීමට පෙර දින මෙම ගුරුවරිය නිවාඩුක් ලබාගෙන ඇති අතර නිඩාවු ලබාගන්නා එම කාල පරිච්ඡේදයට අදාළව ඉගැන්වීම් කටයුතු සිදු කිරීම සඳහා වෙනත් ගුරුවරයෙකු යොදවා නොමැති බවත් නිරීක්ෂණය වේ.

- ඉහත දක්වන ලද සියලුම සාක්ෂි අනුව පළමු වන වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් මෙකී පහරදීම සිදු කර ඇති බව කොමිෂන් සභාවට සනාථ වේ.

- තවද ගුරුවරයෙකු විසින් තම ශිෂ්‍යයින් පිළිබඳ මනා අවබෝධයක් වගකීමකින් යුතුව කටයුතු කළ යුතු වුවද, පළමුවන වගඋත්තරකරු විසින් මෙම වින්දිත දැරිය තමා දුටු පළමු දිනය මෙම සිදුවීම සිදුවූ දිනය බව සඳහන් කර තිබේ. ඒ අනුව තමා ඉගැන්වීම් කටයුතු සිදුකරනු බලන බටහිර සංගීත විෂය හදාරනු ලබන සිසුන් කවුරුන් ද යන්න පිළිබඳ වගකීමකින් යුතුව මෙම ගුරුවරිය කටයුතු කර ඇත්ද යන්න ගැටලුවකි.

- මෙම සිදුවීම සම්බන්ධයෙන් වින්දිත දැරියගේ මව විසින් සිදුවීම සිදුවූ දින එනම් 2022.06.08 දින රාත්‍රියේ 6 සී පන්තිය භාරව කටයුතු කරනු ලබන ටී. ජෙයප්‍රියා මිය සහ පාසලේ සහකාර විදුහල්පති ලෙස කටයුතු කරනු ලබන අමා නිලංගි විජේසේකර මිය දුරකථනය ඔස්සේ දැනුවත් කර ඇත. තවද ටී. ජෙයප්‍රියා මිය විසින් වින්දිත දැරියගේ මව විසින් ලබාදුන් දුරකථන පණිවිඩ සම්බන්ධයෙන් අංශ ප්‍රධානී එස්. එම්. විරාජනී මිය දැනුවත් කර ඇත. එම අවස්ථාවේ දී එස්. එම්. විරාජනී මිය විසින් වින්දිත දැරියගේ මව වෙත දුරකථනයෙන් අමතා මේ පිළිබඳව විමසීම් කර තිබේ. ඒ බව මෙම ගුරුවරුන් / පාසල් බලධාරීන් විසින් මහරගම පොලිස් ස්ථානයට ලබාදුන් ප්‍රකාශ සටහන් වල සහ මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් සිදුකරන ලද විමර්ශනයේ දී පිළිගෙන තිබේ. ඒ අනුව මෙම සිදුවීම සිදුවූ දින රාත්‍රියේදීම මෙකී පහරදීම සම්බන්ධයෙන් මෙම ගුරුවරුන් / පාසල් බලධාරීන් ඉතා හොඳින් දැනුවත් වී ඇති නමුත්, එදින හෝ ඉන් පසු දිනක දී හෝ වින්දිත දැරිය සම්බන්ධයෙන් කිසිදු සොයාබැලීමක් ද සිදුකර නොමැති බව නිරීක්ෂණය වන අතර, මේ පිළිබඳව මහරගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් සිදුකරන ලද විමර්ශනය තුළින් ද අනාවරණ

කරගෙන තිබේ. ඒ අනුව දරුවන්ගේ සුභසිද්ධිය උදෙසා වගකීමකින් කටයුතු කළ යුතුව ඇති ගුරුවරුන් / පාසල් බලධාරීන් එසේ වගකීම් සහගතව කටයුතු කර ඇති බවක් නොපෙනේ.

❖ එමෙන්ම දෙවන වගඋත්තරකරු වන බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ විදුහල්පති කේ. ඒ. චන්ද්‍රලතා මිය මෙම සිදුවීම පිළිබඳ කිසිදු දැනුවත් වීමක් නොති බූ බවත් 2022.06.09 දින මහරගම පොලිස් ස්ථානය විසින් මෙකී සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් පැමිණිල්ලක් සිදුකර ඇති බවට දැනුම්දුන් අවස්ථාවේදී තමා ඒ පිළිබඳව පළමු වරට දැනුවත් වූ බවත් ප්‍රකාශ කර ඇත. තවද වින්දිත දැරියගේ දෙමාපියන් විසින් කිසිදු අවස්ථාවක තමා දැනුවත් නොකළ බව වැඩිදුරටත් සඳහන් කර තිබේ. එහෙත් පාසලේ පරිපාලන නිලධාරියා සහ සිසු දරුවන් සම්බන්ධයෙන් වගකිව යුතු පළමු නිලධාරියා වශයෙන් මෙම පහරදීම සිදුවූ බවට දැනුවත් වූ පළමු අවස්ථාවේදී හෝ වින්දිත දැරියගේ දෙමාපියන් වෙතින් විමසීමක් සිදුකිරීමට විදුහල්පති කටයුතු කර නොමැති අතර, 2022.07.06 දින දැරියගේ පියා පාසලට පැමිණ දැරියගේ අස්වීම් සහතිකය ලබාගන්නා අවස්ථාවේ දී හෝ මේ පිළිබඳව විදුහල්පතිනිය විසින් විමසීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ. එමගින් පෙනී යන්නේ මෙම පහරදීම සිදුවී මාසයකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද විදුහල්පතිනිය විසින් එදින හෝ දැරියගේ පියාගෙන් මේ පිළිබඳව විමසීමක් සිදුකර නොමැති බවයි. පාසලේ ඉගෙනුම ලබන දරුවන් සම්බන්ධයෙන් පූර්ණ වගකීම භාර නිලධාරියා වශයෙන් අදාළ දෙමව්පියන් ගෙන් විමසුමක් සිදු නොකර, දෙමාපියන් විසින් තමා දැනුවත් නොකළ බවට චෝදනා කිරීම තුළින්, දෙවන වගඋත්තරකරු විදුහල්පතිවරයෙකු වශයෙන් වගකීම් සහගතව කටයුතු කර නොමැති බව කොමිෂන් සභාවට පෙනීයයි.

❖ එමෙන්ම චක්‍රලේඛ අංක 12/2016 මගින් සිසුන්ට ශාරීරික දඬුවම් ලබාදිය නොහැකි බවට සියලුම පාසල් වල විදුහල්පතිවරු දැනුවත් කර ඇති අතර, එකී දැනුවත් කිරීම් පාසලේ ගුරුභවතුන් වෙත ලබාදෙමින් ශාරීරික හා මානසික දඬුවම් වලින් සිසු දරුවන් ආරක්ෂා කිරීමේ පළමු වගකීම දරණ නිලධාරියා වශයෙන් දෙවන වගඋත්තරකරු වන කේ. ඒ. චන්ද්‍රලතා මිය (විදුහල්පති - බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය) විසින් මෙකී සියලු වගකීම් පැහැර හරමින් කටයුතු කර ඇති බව ද තවදුරටත් පෙනීයයි.

❖ ශ්‍රී ලංකාව තුළ දරුවන් සම්බන්ධයෙන් එවැනි සුවිශේෂී නීතිමය රාමුවක් පවතින පසුබිමක සහ අධ්‍යාපනය ලබන දරුවන්ට, සෑම දරුවෙක්ට ම සමාජ ගරුත්වයක් සහ අයිතිවාසිකම් පවතින බව ඉගැන්විය යුතු හා එමෙන්ම ආදර්ශවත් විය යුතු විදුහල්පතිනියක් වශයෙන් හා රජයේ වගකිවයුතු නිලධාරියෙකු වශයෙන් දෙවන වගඋත්තරකරු වන කේ. ඒ. චන්ද්‍රලතා මිය මෙම සිදුවීමේදී කටයුතු කර ඇති ආකාරය අනුව පාසලක විදුහල්පති භූමිකාව අවබෝධ කරගෙන තිබේද යන්න ප්‍රශ්නගත වේ.

❖ තවද 04, 05 සහ 06 වශයනේ නම්කර ඇති වගඋත්තර පාර්ශවයන් වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ (කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, මහරගම) සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව) හා ස්ථානාධිපති, ළමා හා කාන්තා කාර්යාංශය (පොලිස්

ස්ථානය - මහරගම) යන පාර්ශවයන් විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අදාළ නීත්‍යානුකූල රාමුව තුළ අවශ්‍ය පරිදි කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

❖ 03 වන වගඋත්තර පාර්ශවය වශයෙන් නම් කර ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිය පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට පැමිණිලිකාරිය විසින් සඳහන් කර තිබුණ ද, 2022.06.08 වනි දින 1929 දරණ ළමා උපකාරක ක්ෂණික ඇමතුම් අංකය වෙත දැරියගේ මව විසින් ලබාදෙන ලද පැමිණිල්ල අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ බලතල ප්‍රකාරව එම තොරතුරු මහරගම පොලිස් ස්ථානය වෙත දැනුම්දෙමින් මෙම පහර දීමට අදාළව විමර්ශනයක් සිදුකර මෙම සිදුවීමට අදාළව නීතිය බලාත්මක කර වාර්තාවක් යොමුකරන ලෙස මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත දැනුම් දී ඇති බව නිරීක්ෂණය වේ. තවද බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත මේ පිළිබඳව දැනුම් දී අදාළ ගුරුවරිය සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් දැනුම් දී ඇති බවට නිරීක්ෂණය වේ. ඒ අනුව 03 වන වගඋත්තර පාර්ශවය ද මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අදාළ නීත්‍යානුකූල රාමුව තුළ කටයුතු කර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

**නිගමනය:**

1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද "ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි" (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස 1991 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. එවන් වූ පසුබිමක මෙකී පැමිණිල්ල අනුව අගතියටපත්ව ඇත්තේ වයස අවුරුදු 11 ක් වූ 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් බව පෙනීයයි. මෙම පැමිණිල්ලට අදාළ සියලුම සාක්ෂි කොමිෂන් සභාව විසින් විමර්ශනයට ලක්කරන ලදි. ඒ අනුව ප්‍රධාන වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් කලණි එරංගා ෂේරසිංහ යන වින්දිත දැරියට පාසල තුළ දී පහරදී ඇති බවට ඉහත දක්වන ලද සියලුම සාක්ෂි අනුව සනාථ වී තිබේ.

මෙකී පහරදීමට තුඩුදුන් කාරණය පිළිබඳ සොයාබැලීමේදී, වින්දිත දැරිය විසින් බටහිර සංගීත විෂයට අදාළව විෂයභාර ගුරුවරිය විසින් (පළමුවන වගඋත්තරකරු) යොමුකරන ලද සටහන් පාසල් වේලාව තුළදී සියලුම සිසු දරුවන්ට සටහන් කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බැවින්, එකී සටහන් නිවසට රැගෙන ගොස් වට්සැප් සමූහක් නිර්මාණය කර පන්තියේ සිසුන්ට ලැබීමට සැලැස්වීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. වින්දිත දැරිය විසින් සිදුකරන ලද මෙම ක්‍රියාව පාසල් විනය පටිපාටියට අනුව විනය විරෝධී ක්‍රියාමක් හෝ කිසියම් ආකාරයක දඬුවමකට යටත් කළ යුතු ආකාරයේ ක්‍රියාවක් නොවන බව පෙනීයයි. ඒ අනුව මෙම සිදුවීමේදී පළමුවන වගඋත්තරකරු විසින් කරුණු විමසීමකින් හෝ සොයාබැලීමකින් තොරව සිය අභිමතය පරිදි කටයුතු කර ඇති බවත් කිසියම් දඬුවමකට යටත්

කළ යුතු ආකාරයේ වන්දක් වින්දිත දැරිය සිදුකර නොමැති බවත් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

2016.04.29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 12/2016 හි 2.0 ශාරීරික දඬුවම් යන්නෙහි 2.1 යටතේ, "ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව සැලසීමේ දී දෙමාපියන්ට හා සමාන වෙනත් ගුරුවරුන්ට ද හිමිවේ ය, යන සංකල්පය පදනම් කරගත් " in Loco Parantis " යන සංකල්පය පදනම් කර ගෙන පාසල තුළ දී අපේක්ෂිත චර්යාවන්ට නොගැළපෙන චර්යාවන් දක්වන සිසුන්ගේ එම අයෝග්‍ය චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරිකව වේදනාවක් ඇතිවන අන්දමින් කරන දඬුවමක් ශාරීරික දඬුවමක් ලෙස හඳුන්වනු ලැබේ.......... ඒ නිසා සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතුව වුව ද කිසිදු ශිෂ්‍යයෙකුට / ශිෂ්‍යාවකට ශාරීරිකව පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් වැලකී සිටීමට සියලුම දෙනා වගබලා ගත යුතු වේ" යනුවෙන් නීතිමය විධිවිධාන නිකුත් කර තිබේ.

තවද එකී චක්‍රලේඛනයේ 2.4 වගන්තිය ප්‍රකාරව "පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුන්ට දඬුවම් දීම සිදු කළහොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ග වලට මුහුණ දීමට සිදුවනු ඇත" යනුවෙන් දක්වා ඇත. ඒ අනුව **2.4 (iii)** හි **"අධ්‍යාපනයට අදාළ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණ වලින් ශාරීරික දඬුවම් ලබාදී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැක" යනුවෙන් දක්වා ඇත. ඒ අනුව පළමු වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් පැමිණිල්ලෙහි අගතියට පත් දැරිය වෙත ශාරීරික දඬුවම් ලබාදෙමින් පාසල් චක්‍රලේඛ අභිබවනය කරමින් කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ.**

එමෙන්ම උක්ත චක්‍රලේඛනයෙහි 2.4 (i) හි දක්වා ඇති පරිදි, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xvi පරිච්ඡේදයේ 126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැක" යනුවෙන් ද දක්වා ඇත. ඒ අනුව **කලණි එරංගා සේරසිංහ යන ශිෂ්‍යාව සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම පළමු වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

**නිර්දේශ :**

ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) විසින්,

1. පළමු වගඋත්තරකරු වන ඩී. එම්. සී. ජයවර්ධන මිය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

2. පාසලේ පරිපාලන නිලධාරියා සහ දරුවන් සම්බන්ධයෙන් වගකීම භාර පළමු නිලධාරියා වශයෙන් දෙවන වගඋත්තරකරු වන බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ විදුහල්පති කේ. ඒ. චන්ද්‍රලතා මිය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙකී පැමිණිල්ල විමර්ශනය කිරීමේ දී අනාවරණය කරගත් පරිදි, බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලයේ 6 සී පන්තියභාරව කටයුතු කරන ලද ටී. ජෙයප්‍රියා මිය, අංශ ප්‍රධානි ලෙස කටයුතු කරන ලද එස්. එම්. විරාජිනී ශාලිකා ගුණතිලක මිය සහ සහකාර විදුහල්පති ලෙස කටයුතු කරන ලද අමා නිලංගි විජේසේකර මිය යන ගුරුවරුන්/ පාසල් බලධාරීන් මෙම සිදුවීමේ දී කටයුතු කර ඇති ආකාරය අනුව ඔවුන් සම්බන්ධයෙන් ද සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

3. සියලුම පාසල්වල ගුරුවරුන් සඳහා ළමයින් සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් මාලාවක් නිකුත් කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ.

2025. 04. 22 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වේ.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත -:

01. අමාත්‍යතුමිය - කා.දැ.ගැ.ස.
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

2. ලේකම් - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.